# 2024

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# Annual Report



## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## விஜய குமாரதுங்க ஞாபகார்த்த வைத்தியசாலை

## Wijaya Kumaratunga Memorial Hospital

# වාර්ෂික වාර්තාව- සිංහල

# 2024

# පටුන

| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම | 03-05 |
| ආයතනික තොරතුරු | 06-07 |
| ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිනියගේ ලිපිය | 08 |
| කාර්ය මණ්ඩල වාර්තාව | 09 |
| රෝහල් සේවා විශ්ලේෂණය | 10-19 |
| 2024 වසරේදී සපුරාගත් ඉලක්ක හා ප්‍රධාන සිදුවීම් හා ලැබුණු පරිත්‍යාග | 20-21 |
| 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ඇතුලු මූල්‍ය ප්‍රකාශ | 22-35 |
| 2024 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව ( 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව ) | 36-42 |

| |
|---|
| **දැක්ම** |
| **අනගිතම සෞඛ්‍ය ආරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම.** |
| **මෙහෙවර** |
| **ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඬුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම, කායික රෝග, ශල්‍ය රෝග, අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍රවල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිනිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුනු කිරීම.** |
| **සාමූහික අභිමතාර්ථයන්** |
| **රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වන පැමිණෙන පොදු ජනයාට කිසිදු පන්ති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අනුදමින් සිදු කරමින් කාර්යක්ෂමව සෞඛ්‍ය සේවා සැපයීම.** |

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2024 වසර සඳහා වූ
# වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
# 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා

**<u>ඓතිහාසික පසුබිම</u>**

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදුව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදුව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදුවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකක් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදුවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල පනත ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ මෙන්ම සායන වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අඩු ආදායම්ලාභී ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම 2004 දී දියත් කර ඇත. ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලද අතර 2007 දී සමස්ථ ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් විය.

2012 වසරේ දී දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය වර්තමානයේ සාමාන්‍ය ගබඩා, රාජකාරී කාමර විවේක කාමර හා දේශන ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

2015 වසරේ දි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන් කර ගැනීමට හැකි වී ඇති අතර එය

රසායනාගාර ගොඩනැගිල්ල ලෙස නම් කර ඇත. වර්තමානයේ ඒ තුල රසායනාගාරය, වෛද්‍ය ලේඛණාගාරය, අභ්‍යන්තර විගණන ඒකකය , ඖෂධ ගබඩාව , උපයෝගීතා කාමර ස්ථාපිත කර ඇත.

2016 වසර තුල ශල්‍ය ඒකකය පිහිටුවනු ලැබූ අතර ශල්‍ය වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් ශල්‍ය ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි

2017 දී ශල්‍ය වාට්ටුව අක්ෂි ගොඩනැගිල්ලට වෙත මාරු කරන ලද අතර 2017 නොවැම්බර් මාසයේදී බාහිර රසායනාගාරය නව රසායනාගාර ගොඩනැගිල්ල තුල ස්ථාපිත කෙරිනි.යෝජිත වාට්ටු සංකීර්ණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම 2017 අග භාගයේ දී විශ්ලේෂණය කෙරිණ.

2019 වසරේදී යෝජිත වාට්ටු සංකීර්ණය ඉදි කිරීම සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී. නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ඉහත යෝජිත වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවිනි.

ප්‍රධාන ව්‍යාපෘති වශයෙන් වසර කීපයක සිට අවශ්‍යතාවයක්ව පැවති ශල්‍යාගාර අලුත්වැඩියාව සහ වෛද්‍යවරුන්ගේ විවේකාගාරයක් ඉදි කිරීම 2019 වසරේදී සිදු කර ගැනීමට හැකිවිනි.

ප්‍රධාන ව්‍යාපෘති ලෙස අක්ෂි ගොඩනැගිල්ලට අයත් අක්ෂි හා ශල්‍ය වාට්ටු , අක්ෂි සායන නවීකරණ කටයුතු 2020 වසරේදී සිදු කර ඇත.

2020 හා 2021 දී වසරේදී ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල් සේවාවට බාධා ඇති වුවද , ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

පවුල් වෛද්‍ය සායනය අලුත්වැඩියා කිරීම 2021 වසරේදී සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘතියකි. පැවති ඒක්ස් රේ යන්ත්‍රය වසර 21 ක් පැරණි බැවින් ජීව විද්‍යා ඉංජිනේරු අංශයෙන් පරිත්‍යාග ලෙස නව යන්ත්‍රයක් ලබා ගැනීමට එවකට සිටි අධ්‍යක්ෂ වෛද්‍ය රෝයි පෙරේරා මහතා සමත් විනි. 2021 වසරේදී රුපියල් මිලියන 19.32 ක් වටිනා නවීන ඔපරේටින් මයික්‍රොස්කොප් යන්ත්‍රයක් අක්ෂි ශල්‍යාගාරය වෙත ලබා ගැනීමට හැකි විනි.

2022 වසරේ පවුල් වෛද්‍ය සායනය ඖෂධ ගබඩාවේ ස්ථාපිත කර ඖෂධ ගබඩාව නව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහල තුල ස්ථාපිත කරන ලදී.

2022 වසරේදී සායන සඳහා නව අය කිරීමේ ක්‍රමයක් හදුන්වා දෙනු ලැබිනි. රට තුල පැවති ආර්ථික තත්වය මත ශල්‍යකර්ම ගාස්තු ද සංශෝධනය කරන ලදී. I O L ශල්‍යකර්ම සඳහා වූ කාච රෝහලෙන් නොසැපයීම මත රජයේ මුදල් ඉතිරි කරගෙන ඇත.

රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත වියදම් අධික ශල්‍යකර්මයන් 02 ක් වන TPPV සහ Silicon Oil Removal යන ශල්‍යකර්ම වල ගාස්තු සංශෝධනයක් සිදු කර ඇත.

එසේම අක්ෂි සායනයේ, ශල්‍ය සායනයේ සහ තුවාල සත්කාර ඒක්කයේ සහ පැමිණෙන රෝගීන්ගේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයේ සංශෝධනයක්ද සිදු කරන ලදී.

2024 නොවැම්බර් මස 04 රෝගීන්ගේ පහසුව සහ රෝගී සත්කාර කටයුතු උසස් කිරීමේ අරමුණින් වාට්ටු අංක 01 ඇසෙහි සුද සදහා ඒක් දින ශල්‍ය ඒකකය බවට පරිවර්තනය කරන ලද අතර ඒමගින් අක්ෂි ශල්‍යකර්ම කඩිනමින් සහ පහසුවෙන් මේ වන විට සිදු කරනු ලබයි.

වර්තමානයේ වාට්ටු 4 ක් සහ ඇඳන් 118 ක් ඇත . (2024)

## ආයතනික තොරතුරු
## 01-01-2024 ~ 31-12-2024

### ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

### ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදූව

### කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

### නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

### විගණකවරු

- විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, 306 /72 , පොල්දූව පාර , බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය,
  අංක 26, ශ්‍රී සංඝරාජ මාවත , කොළඹ 10

## අධ්‍යක්ෂ මණ්ඩලය

## 01-01-2024 ~ 31-12-2024

**සභාපතිනි**

- හිටපු ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

**අධ්‍යක්ෂ** මණ්ඩලය

- වෛද්‍ය අසේල ගුණවර්ධන**,** සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**,** සෞඛ්‍ය අමාත්‍යාංශය
- එන්**.**ඒ**.** උමගිලිය මයා
- වයි.සුමනා යාපා මෙය- භාණ්ඩාගාර නියෝජිත
- ආනන්ද විමලසේන මයා
- විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය චරිත් ෆොන්සේකා මයා
- විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍ය චාමර කුමාරගේ මයා

## විගණන කමිටුව

## 01-01-2024 ~ 31-12-2024

### සභාපති

වයි.සුමනා යාපා මෙය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

### නිරීක්ෂක

ආර්.එම්.එස්.වසන්තා මිය , ප්‍රධාන අභ්‍යන්තර විගණක , සෞඛ්‍ය අමාත්‍යාංශය,
ඒ.කේ.ඩී.ඉනෝකා මිය , විගණන අධිකාරි , ජාතික විගණන කාර්යාලය , බත්තරමුල්ල

### සාමාජික

වෛද්‍ය ඩී.ජී.ඒ.රණවීර මයා, ප්‍රධාන වෛද්‍ය නිලධාරි ,රාජකාරි ආවරණ අධ්‍යක්ෂ, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

<u>සහභාගිත්වය</u>

පී.ඩී.ටී.පී.එන්.බර්නාඩ් මිය, ගණකාධිකාරී, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
ආර්. ඒ ඒ එස් කේ රණසිංහ මයා, පරිපාලන නිලධාරී , විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදූව

# සභාපතිවරිය විසින් වාර්ෂික වාර්තාව යොමු කිරීමේ ලිපිය

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

<u>2024 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව</u>

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2024 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
සභාපතිනී,
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
සීදූව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

## 2024 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | 2024-12-31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | 0 |
| නිර් වින්දන විශේෂඥ වෛද්‍ය | 1 | 1-ද්විතියික පදනම මත |
| කායික රෝග විශේෂඥ වෛද්‍ය | 2 | 1-තාවකාලික අනුයුක්ත කිරිම |
| පවුල් වෛද්‍ය විශේෂඥ | 1 | 0 |
| ශල්‍ය වෛද්‍ය විශේෂඥ | 1 | 1 |
| අන්තරාසර්ග විශේෂඥ වෛද්‍ය | 1 | 0 |
| අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය | 2 | 2 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | 1 | 1 |
| වෛද්‍ය නිලධාරී | 28 | 17 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 2 | 0 |
| අභ්‍යන්තර විගණක | 1 | 0 |
| ගණකාධිකාරී | 1 | 1 |
| ලියාපදිංචි වෛද්‍ය නිලධාරී | 2 | 2 |
| විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | 1 | 0 |
| හෙද සොයුරිය | 3 | 1 |
| හෙද නිලධාරී | 85 | 77 |
| පරිපාලන නිලධාරී | 1 | 1 |
| ඖෂධවේදී | 6 | 6 |
| විකිරණශිල්පී | 2 | 1 |
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 5 | 3 |
| අක්ෂි තාක්ෂණවේදී | 4 | 4 |
| පෝෂණවේදී | 1 | 0 |
| වැඩ මූලික | 1 | 0 |
| වායු සමීකරණ කාර්මික ශිල්පී | 1 | 0 |
| විද්‍යුත් යන්ත්‍ර රේඛණ ශිල්පී | 2 | 2 |
| කලමණාකරණ සහකාර | 11 | 11 |
| ඖෂධ සංයෝජක | 3 | 2 |
| ආහාර නිරීක්ෂිකා | 1 | 1 |
| නිවාස භාරකාරිනී | 1 | 0 |
| වෛද්‍ය ලේඛණාගාර සහකාර | 1 | 0 |
| වාට්ටු ලිපිකරු | 1 | 0 |
| රියදුරු | 5 | 5 |
| විදුලි කාර්මික | 1 | 1 |
| නඩත්තු කම්කරු | 3 | 2 |
| ලැබ් ඕඩර්ලි | 2 | 2 |
| අරක්කැමි | 3 | 2 |
| දුරකථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී | 3 | 1 |
| සෞඛ්‍ය කාර්ය සහයක | 69 | 60 |
| **එකතුව** | **260** | **208** |

**ප්‍රධාන වෛද්‍ය නිලධාරී රෝහල් අධ්‍යකෂක තනතුරේ රාජකාරී ආවරණය කරන අතර හෙද සොහොයුරිය විසින් විශේෂ ශ්‍රේණියේ හෙද නිලාදරිනී තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලබයි.**

# රෝහල මගින් ලබා දෙන සේවා

## හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ. බාහිර රෝගී අංශය (OPD), ප්‍රාථමික සත්කාර ඒකකය (PCU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සලසා දේ. කායික වෛද්‍ය වාට්ටු, ශල්‍ය වාට්ටු, අක්ෂි වාට්ටු, තුවාල සත්කාරක වාට්ටුව, ඇසෙහි සුද සඳහා ඒක් දින ශල්‍ය ඒකකය හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සලසා දේ.

2024 වසරේ වාට්ටුගතව ප්‍රතිකාර ලබා ගත් ප්‍රතිශතය 64.91% ක් විය.

2024 වසරේදී මුලු රෝගී වාට්ටුගත ඇතුලත්වීම් 15202 ක් විය.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි ඩිස්පෙන්සරිය, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. මෙම රෝහල ඒ වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වසරේදී වර්ග කර ඇත.

අභ්‍යන්තර කළමණාකරනය අවශ්‍ය වන වෛද්‍ය, ශල්‍ය හා අක්ෂිමය සංකූලතා වලින් පෙලෙන රෝගීන් බාහිර රෝගී අංශය, ප්‍රාථමික සත්කාර ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ. MRI, CT ස්කෑන් වැනි විශේෂ පරික්ෂණ අවශ්‍යවන රෝගීන්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල වැනි රෝහල් වලට යොමු කෙරේ.

2022 දී රෝහල් ගාස්තු වැඩි කිරීමත් , කාචය රෝගීයා විසින්ම මිලදී ගැනීමට ගත් තීරණයත් නිසා රජයට දැරිය යුතු මූල්‍ය බර අඩු කර ගැනීමට හැකි විනි.

## 1. බාහිර රෝගී අංශය (OPD)

රෝහලේ බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ සීදූව කොටුගොඩ,රද්දොළුව, කදාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර සඳහා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර දිනපතා උදේ 8 සිට සවස 4 දක්වා බාහිර රෝගී අංශය ක්‍රියාත්මක වේ.එම නිවාඩු දින වල බාහිර රෝගී අංශය පෙ.ව. 8 සිට 10.30 දක්වා ක්‍රියාත්මක වේ.බාහිර රෝගී අංශ රෝගීන්ට සියලුම ඖෂධ වර්ග රෝහල් ඩිස්පැන්සරියෙන් ලබා දේ.බාහිර රෝගී අංශයේ රෝගීන් සඳහා ඊ.සී.ජී හා ඒක්ස් රේ පහසුකම් සලසා ඇත.

අවශ්‍ය අවස්ථා වල බාහිර අංශ රෝගීන් වෛද්‍ය සායනයට , අන්තරාසර්ග රෝග සායනයට හා ශ්වසන රෝගී සායනය වෙත යොමු කෙරේ.

2024 වසර තුල බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව **109090** කි.

බාහිර රෝගී අංශය මගින් සැරහුම් යෙදීම් **2756** ක් හා එන්නත් ලබා දීම් **874** ක් ද සිදු කර ඇත.

1 වගුව මගින් බාහිර රෝගී අංශයට සම්බන්ධ පසුගිය වසර 5 තුල තත්වය විදහා දැක්වේ.

## 2. ප්‍රාථමික සත්කාර ඒකකය (PCU)

පැය විසිහතර පුරා විවෘතව ඇති ප්‍රාථමික සත්කාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු , පිහි ඇණුම් හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. උග්‍ර හදිසි අවස්ථා ප්‍රාථමික සත්කාර ඒකකයේ කළමණාකරණය කරනු ලබන අතර වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි වැඩිදුර කළමණාකරණය අවශ්‍ය රෝගීන් රෝහලේ අදාල වාට්ටු වලට ඇතුලත් කර ඇත. සිදු කරනු ලබන ප්‍රතිකාර වලට අමතරව විශේෂිත වෛද්‍ය සත්කාර අවශ්‍ය වන රෝගීන් විශේෂිත ප්‍රතිකාර සඳහා මීගමුව රෝහල , උතුරු කොළඹ ශික්ෂණ රෝහල ,ජාතික අක්ෂි රෝහල යන රෝහල් වෙත වෙතට මාරු කෙරේ.

ප්‍රාථමික සත්කාර ඒකකයෙන් 2024 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව **19790** ක් විය.ගත වූ වසර 5 ට අදාළව ප්‍රාථමික සත්කාර ඒකකයේ සංඛ්‍යා ලේඛන 1 වගුව තුල දක්වා ඇත.

## 3. දන්ත ඒකකය

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ.ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සතියේ සෑම දිනකම ද , පාසැල් සිසුන් සඳහා සෙනසුරාදා දිනවල ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් ,දත් සුද්ද කිරීම , ළමා දන්ත ප්‍රතිකාර, සුළු සැත්කම් ප්‍රතිකාර සායනය තුලදී සිදු කෙරේ. මියුකොසිල් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ මාර්ග අනතුරු වලින් සිදු වූ දන්ත අබාධ ප්‍රතිකාර යන ප්‍රතිකාර සිදු කරන සුළු සැත්කම් අතර කිහිපයකි.

2024 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව **5641** ක් විය**.** ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත**.**

## 4. කායික වෛද්‍ය ඒකකය

කායික වෛද්‍ය ඒකකය ගැහැණු හා පිරිමි වශයෙන් වෙන් කල වාට්ටු 1 කින් සමන්විත වන අතර හා වෛද්‍ය සායනයකින් වේ. වාට්ටුවෙහි පිරිමි රෝගීන් සඳහා ඇඳන් 10 ක් ද ගැහැණු රෝගීන් සඳහා ඇඳන් 10 ක් ද ඇත. වෛද්‍ය සායනය සදුදා සිට සෙනසුරාදා දක්වා පවත්වනු ලැබේ. දියවැඩියාව,අධි රුධිර පීඩනය , ඇදුම සහ වෙනත් කායික රෝග වැලඳී ඇති රෝගීන් හට මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.සෙනසුරාදා දිනයේ අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරියක විසින් පවත්වනු ලබන අන්තරාසර්ග රෝග සායනයක් පැවැත්විනි.එය විශේෂිත දියවැඩියා සායනයක් ද වන අතර අඩු වයස් රෝගීන් ( පලමු වර්ගයේ දියවැඩියා) , තයිරොයිඩ් ඌනතා සහ අනෙකුත් අන්තරාසර්ග රෝග සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

2024 වසර තුල වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 46667 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 (පිරිමි වාට්ටුව ) හා 2 (ගැහැණු වාට්ටුව) ට සම්බන්ධ සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

### වෙනත් විශේෂ සායනය

- **වෙනත් සායන ( බෝ නොවන රෝග සායනය ,සුවනාරි සායනය ,පවුල් සංවිධාන සායනය)**

බෝ නොවන රෝග( NCD) සායනය , සුවනාරි හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි. මෙම සායන මගින් සැගවුනු රෝග පිලිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කරනු ලබන අතර දැනුවත් කිරීමේ වැඩසටහන් කාලානුරූපීව සංවිධානය කර ඇත.බෝ නොවන රෝග , සුවනාරි සහ පවුල් සංවිධාන සායන මගින් 2024 වසර තුලදී පිළිවෙලින් රෝගීන් **510** , **158** හා **11**දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත. ගත වූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- **ජංගම සායන Visiting clinic**

අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු රෝහලේ නොමැති වුවද බාහිර විශේෂඥ වෛද්‍යවරියක විසින් අන්තරාසර්ග රෝග පිලිබඳ සායනයක් පවත්වනු ලබයි.

මීගමුව රෝහලේ මනෝවෛද්‍ය විශේෂඥවරයාගේ අධික්ෂණය යටතේ එහි මනෝචිකිත්සක ඒකකයේ පුහුණුව ලත් **ජොෂ්ඨ** වෛද්‍යවරයෙකු විසින් මනෝවෛද්‍ය සායනය පවත්වාගෙන යනු ලැබේ.

2023.06.21 දින සිට ශ්වසන රෝග සම්බන්ධයෙන් නව සායනයක් ආරම්භ කිරීමද සිදු කරන ලදී.

ඒසේම 2024 ජුලි මස සිට වකුගඩු රෝග සම්බන්ධයෙන් වූ නව සායනයක් ආරම්භ කිරීමද සිදු කරන ලදී.

අන්තරාසර්ග සායනය සහ මනෝ වෛද්‍ය සායනය සහ ශ්වසන රෝග සායනය සතියකට වරක් ක්‍රියාතමක වන අතර අවට රෝහල් වලින් සහ සායන වලින් යොමු කරන රෝගීන්ට මෙහි ප්‍රතිකාර ලබා දෙනු ලබයි.

2024 වසර තුල මුළු රෝගී සංඛ්‍යාව පිළිවෙලින්

- අන්තරාසර්ග රෝග සායනය - **11281**
- මානසික රෝග සායනය - **2388**
- ශ්වසන රෝග - **384**
- වකුගඩු රෝග සායනය - **386**

ගත වූ වසර පහ තුල ජංගම සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

## 5. <u>ශල්‍ය ඒකකය</u>

ශල්‍ය ඒකකය 2016 මැද භාගයේ දී අලුතින් ස්ථාපිත කරන ලදී . එක් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් සහ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශල්‍ය ඒකකය සමන්විත වේ. වර්තමානයේ ඇදන් **27** කින් යුතු වාට්ටුවක් මෙම ඒකකය සතු වේ.2016 අවසාන භාගයේදී ශල්‍ය ඒකකය වෙත නවීන එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම සිදු විය.

ශල්‍යාගාර සංකීර්ණයේ සාමාන්‍ය ශල්‍යකර්ම සදහා වෙනම ශල්‍යාගාරයක් ඇති අතර එය සතියේ බොහෝ දින වල ශල්‍ය ඒකකය මගින් භාවිත කර ඇත.

2024 වසර තුල ශල්‍ය ඒකකය මගින් ලබා දුන් සේවාවන් පහත පරිදි වේ.

| විස්තරය | මුලු සංඛ්‍යාව |
|---|---|
| සායනික රෝගීන් සංඛ්‍යාව | 6653 |
| මුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 1002 |
| ප්‍රධාන ශල්‍යකර්ම සංඛ්‍යාව | 436 |
| සුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 287 |
| ඩුප්ලෙක්ස් ස්කෑන් සංඛ්‍යාව | 525 |
| Sclerotherapy ක්‍රියා පටිපාටිය | 227 |
| පී ආර් පී එන්නත් ලබා දීම | 241 |
| එම් පී එන්නත් ලබා දීම | 68 |
| FNAC ක්‍රියා පටිපාටිය | - |
| මුලු එන්ඩොස්කොපි පරීක්ෂණ සංඛ්‍යාව | 317 |
| UGIE ක්‍රියා පටිපාටිය | 62 |
| LGIE ක්‍රියා පටිපාටිය | 94 |
| කොලනොස්කොපි සංඛ්‍යාව | 27 |
| Proctoscopy පටිපාටිය සහ Sclerotherapy එන්නත් සංඛ්‍යාව | 49 |
| බයොප්සි - UGIE සහ LGIE | 40 |
| Endovenous Radiofrequency Ablation (EVRFA) | 279 |

## තුවාල සත්කාර සායනය හා වාට්ටුව

විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයාගේ උපදේශනය යටතේ පාලනය වන මෙම අංශය ඇඳන් 14 කින් යුත් වාට්ටු ඒකකින් හා සායනයකින් සමන්විත විය.

දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මෙම සායනය සඳහා රෝගීන් පැමිණෙන අතර නිදන්ගත තුවාල සඳහා වාට්ටුගත ප්‍රතිකාර මෙන්ම සායනික ප්‍රතිකාර ලබා දුනි.සෑම වසරකම තුවාල සත්කාර ඒකකයට සහ ශල්‍ය වෛද්‍ය ඒකකයට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කර ඇත.

2024 වසරේ තුවාල සත්කාර සායනය වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව 7013 ක් විය.

ගත වූ වසර පහ තුල මේ පිලිබඳ දත්ත 5 වන වගුව තුල දැක්වේ.

## 6. අක්ෂි ඒකකය

විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයන් දෙදෙනෙකු හා වෛද්‍ය නිලධාරීන් 5 දෙනෙක් මෙම අංශයට අනුයුක්ත කර ඇත .


මෙම ඒකකය ට අක්ෂි සායනය, ඇඳන් 40 කින් යුත් අක්ෂි වාට්ටුව හා අක්ෂි ශල්‍යාගාරය ඇතුළත් වන අතර මෙම ඒකකය මගින් පහත සේවාවන් ලබා දී ඇත.

1.අක්ෂි සැත්කම්
2.අක්ෂි සායන
3.පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාවන්
4.අක්ෂි පරීක්ෂණ
5.ලේසර් ප්‍රතිකාර

අක්ෂි ඒකකය මගින් අවට ප්‍රදේශයේ රෝගීන්ට පමණක් නොව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර ලබාදේ.

- **අක්ෂි සැත්කම්**

ප්‍රධාන වශයෙන්ම ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදු කරනු ලබන අතර සිදු කරන ලද ශල්‍යකර්ම වර්ග පහත දැක්වේ.



2024 වසර තුල ප්‍රධාන අක්ෂි ශල්‍යකර්ම 10588 ක් හා සුලු ශල්‍යකර්ම 645 ක් සිදු කර ඇත.ඒ අනුව මුලු අක්ෂි
ශල්‍යකර්ම සංඛ්‍යාව 11233 ක් වේ.

- **<u>අක්ෂි සායන</u>**

දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විවිධ අක්ෂි ආබාධ සහිත රෝගීන් මෙම සායන වලට පැමිණ ඇත. medical retina, surgical retina, uveitis, variety of corneal diseases, strabismus, ocular tumours , oculoplasty and neuro-ophthalmic cases වැනි ගැටලු සහිත රෝගීන්ට මෙහිදී ප්‍රතිකාර සැලසේ. සියලු අක්ෂි හදිසි අනතුරු සඳහා දිනපතා අක්ෂි සායනයේදී ප්‍රතිකාර සැලසේ.

සාමාන්‍ය අක්ෂි සායනයට අමතරව අක්ෂි දියවැඩියා සායනය ග්ලුකෝමා සායනය මෙන්ම අක්ෂි ළමා සායනයද පැවැත්වේ. ඒ සඳහා සහභාගී වන රෝගීන් සංඛ්‍යාව 197,233 සහ 1099 කි.

2024 වසරේදී සාමාන්‍ය අක්ෂි සායන රෝගීන් 45241 ක් සඳහා ප්‍රතිකාර සලසා ඇත. අක්ෂි සායනය සඳහා පැමිණි මුලු රෝගීන් සංඛ්‍යාව 46770 කි.

- **<u>පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාකරණ සේවාව</u>**

දෛනික සායනික වේලාවෙන් පසු අක්ෂි වාට්ටුව වෙත පැමිණි අක්ෂි අනතුරු සහ හදිසි රෝගීන් 8847 ක් සඳහා 2024 වසරේදී ප්‍රතිකාර ලබා දී ඇත.

- **<u>අක්ෂි පරීක්ෂණ</u>**

මෙම ඒකකය විවිධ අක්ෂි පරීක්ෂණ පහසුකම් වලින් සමන්විත වේ.

I. දෘෂ්ඨි විතාන පරීක්ෂණ- Spectral domain OCT machine, B scanner, FFA
II. ග්ලූකෝමා පරීක්ෂණ-, OCT- RNFL
III. Biometry පරීක්ෂණ - A and B ultrasound scanner, IOL master

2024 වසරේදී OCT පරීක්ෂණ 3100 ක් ද Biometry පරීක්ෂණ 11050 ක් අක්ෂි අංශයේදී සිදු කර ඇත.

<u>ඇසෙහි සුද සඳහා ඒක් දින ශල්‍ය ඒකකය</u>

2024 නොවැම්බර් 04 දින සිට රෝගීන්ගේ වඩාත් පහසුව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා වට්ටු අංක 01 ඇසෙහි සුද සඳහා ඒක් දින ශල්‍ය ඒකකය ලෙස ස්ථාපනය කර අතර 2024 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා රෝගීන් 1591 ක් සඳහා ප්‍රතිකාර සිදු කර ඇත.

- **<u>ලේසර් ප්‍රතිකාර</u>**

ලේසර් පහසුකම භාවිතයෙන් දියවැඩියා රෙටිනෝපති කලමණාකරණය විශාල ප්‍රමාණයක් සිදු කරනු ලබන අතර දෘෂ්ඨි විතානයේ ශිරා අවහිරතා , දෘෂ්ඨි විතානයේ පර්යන්ත පරිහානිය ආදිය ඉවත් කර ඇත . PRP ලේසර්

21ක්ද, FLT ලේසර් 15 ක්ද, YAG CAP ලේසර් 311 ක්ද, Barrier ලේසර් 14 ක්ද වෙනත් ලේසර් 01 ක්ද ඇතුලුව 2024 වසර තුල මුලු ලේසර් ප්‍රතිකාර 362 ක් සිදු කර ඇත.

## සහයක සේවා

### 7. වෛද්‍ය රසායනාගාරය

වෛද්‍ය රසායනාගාරය නවීන පහසුකම් වලින් යුත් උපකරණ වලින් සමන්විත වන අතර ලේ සාම්පල් ලබා ගැනීම විධිමත් කිරීම සඳහා වෙනම සාම්පල් කාමරයක් ස්ථාපිත කර ඇත. වෛද්‍ය රසායනාගාරය තුල වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් තිදෙනෙක් අනුයුක්තව ඇත. සඳුදා සිට සෙනසුරාදා දක්වා ද , මසකට එක් ඉරිදාවක්ද රසායනාගාරය ක්‍රියාත්මක වේ.

2024 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 53507 ක් විය.

### 8. ඊ.සී.ජී.අංශය

විද්‍යුත් ඛන්තු රේඛණ ශිල්පින් දෙදෙනෙක් විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට සේවාව සැපයේ. මෙම අංශය විවෘතව තබන කාලයෙන් පරිබාහිර කාලයේදී අත්‍යාවශ්‍ය රෝගීන්ගේ ඊ සී ජී ප්‍රාථමික සත්කාර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

2024 වසරේදී සිදු කල මුලු මුළු ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව 5184 ක් විය.

### 9. එක්ස් කිරණ අංශය

එක් විකිරණ ශිල්පියකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විතව ඇත.නවීන CR යන්ත්‍රය ස්ථාපිත කිරීමත් සමග හානිකර රසායන ද්‍රව්‍ය වලට නිරාවරණය වීම අඩු විය .

2024 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව **3904** ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යා ලේඛන 7 වන වගුව තුල දක්වා ඇත.

## රෝගී සේවාවන් සම්බන්ධ සංඛ්‍යාලේඛණ සාරාංශය

අංක 1 වගුව

| අංශය | ප්‍රතිකාර කරන ලද මුළු රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| බාහිර ප්‍රතිකාර ඒකකය | 71,212 | 47,514 | 82,565 | 113,317 | 109,090 |
| බාහිර ප්‍රතිකාර ඒකකය - එන්නත් | 1,102 | 1,126 | 1,072 | 871 | 874 |
| බාහිර ප්‍රතිකාර ඒකකය - සැරහුම් | 8,703 | 6,395 | 5,312 | 2,824 | 2,756 |
| ප්‍රාථමික සත්කාර ඒකකය | 15,134 | 11,256 | 15,438 | 18,196 | 19,790 |
| දන්ත සායනය | 4,757 | 3,671 | 4,610 | 4,032 | 5,641 |

කායික වෛද්‍ය ඒකකය

අංක 2 වගුව

| අංශය | සහභාගී වූ මුළු රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| වෛද්‍ය සායනය | 34,012 | 30,212 | 36,160 | 45,777 | 46,667 |

| අංශය | වාට්ටුගත රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| වෛද්‍ය වාට්ටු අංක 1 - පිරිමි | 731 | 619 | 749 | 757 | 568 (ඔක්තොම්බර් මස දක්වා) |
| වෛද්‍ය වාට්ටු අංක 2 - ගැහැණු | 1,046 | 851 | 1,009 | 1216 | 1089 |

වෙනත් විශේෂ සායන

අංක 3 වගුව

| අංශය | සායන සඳහා සහභාගී වූ මුළු රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| පවුල් වෛද්‍ය සායනය | 6,929 | 5,275 | 6,013 | - | - |
| බෝ නොවන වෛද්‍ය සායනය | 279 | 426 | 555 | 770 | 510 |
| සුවනාරි සායනය | 15 | 439 | 687 | 209 | 158 |
| පවුල් සැලසුම් සායනය | | 16 | 54 | 24 | 11 |

ජංගම සායන

අංක 4 වගුව

| අංශය | සායන සඳහා සහභාගී වූ මුළු රොගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| දියවැඩියා සහ අධිරුධිර පීඩන සායනය | 5,413 | 2,960 | - | - | - |
| ළමා රෝග සායනය | 182 | - | - | - | - |
| මානසික රෝග සායනය | 1,895 | 1,601 | 1,898 | 2299 | 2,388 |
| උගුර කණ නාසය සායනය | 135 | - | - | - | - |
| අන්තරසර්ග රෝග සායනය | | 1,659 | 7,659 | 8409 | 11,281 |

ශල්‍ය අංශය

අංක 5 වගුව

| අංශය | මුළු රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ශල්‍ය සායනය | 3,261 | 4,829 | 6,545 | 6783 | 6,653 |
| එන්ඩස්කොපි පරීක්ෂණ | 748 | 566 | 430 | 432 | 317 |
| සාමාන්‍ය ශල්‍යකරම | 675 | 767 | 903 | 1062 | 1,012 |
| වාට්ටු අංක 6 (ගැහැණු සහ පිරිමි) | 2,544 | 2,284 | 2,496 | 2731 | 2,733 |
| තුවාල සත්කාර ඒකකය | 11,179 | 9,316 | 11,035 | 5679 | 7,013 |
| වාට්ටු අංක 5 - තුවාල සත්කාර වාට්ටුව - ගැහැණු සහ පිරිමි | 119 | 119 | 176 | 330 | 387 |

අක්ෂි අංශය

අංක 6 වගුව

| අංශය | මුළු රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| අක්ෂි සායනය | 30,078 | 27,603 | 31,893 | 44549 | 46,770 |
| අක්ෂි ශල්‍යකරම | 3,724 | 5,521 | 5,823 | 9927 | 11,283 |
| වාට්ටු අංක 3 - ගැහැණු සහ පිරිමි | 4,410 | 5,679 | 5,941 | 10363 | 10,425 |
| ලේසර් ප්‍රතිකාර | 723 | 1,072 | 873 | 867 | 363 |
| Refractive පරීක්ෂණ | 5,602 | 5,549 | 9,638 | 9484 | 11,050 |
| DCSU | - | - | - | - | 1591 |

<u>සහයක සේවා</u>

අංක 7 වගුව

| අංශය | Total No. of Patients | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| රසායනාගාර පරීක්ෂණ | 69,697 | 53,177 | 55,696 | 55129 | 53,507 |
| එක්ස් රේ පරීක්ෂණ | 1,929 | 1,816 | 1,963 | 1518 | 3,904 |
| ඊසීජී පරීක්ෂණ | 5,409 | 3,869 | 4,045 | 4297 | 5,184 |

## 2024 වසරේ සපුරාගත් ඉලක්ක

1) **වෛද්‍ය උපකරණ මිලදී ගැනීම්**

| ප්‍රධාන වෛද්‍ය උපකරණ- | රු.මිලියන |
|---|---|
| Laparoscopy Monitor | 3.73 |

2) **ලී බඩු සහ සවිකිරීම් , යන්ත්‍රෝපකරණ සහ පරිගණක උපකරණ මිලදී ගැනීම්**

| | රු.මිලියන |
|---|---|
| පරිගණක උපාංග -ලැයිස්තුව අනුව | 0.20 |
| ලී බඩු උපකරණ ( මේස , පුටු , කබඩ් යනාදිය ) | 0.11 |
| යන්ත්‍රෝපකරණ | 0.62 |

## 2024 වසරේ ප්‍රධාන සිදුවීම්

- විජය කුමාරතුංග ශ්‍රීමතාණන් සිහි කිරීම සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන ලේ දන් දීමේ වැඩසටහන 2024.02.16 දින සිදු කිරීම.
- තරුණ පරම්පරාව සඳහා දියවැඩියාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.02.16 දියත් කිරීම.
- සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය විසින් 2024 පෙබරවාරි 19 වන දින රෝහල් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා සිදු කරන ලද රුධිර සීනි පරීක්ෂාව
- 2024 මාර්තු 19 වන දින පැවති ආසාදන පාලන දැනුම යාවත්කාලීන දේශන මාලාවේ පළමු දේශනය
- වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය උදාන රත්නපාල මහතා විසින් 2024 අප්‍රේල් 7 වැනි දින පැවැත් වූ කාලෝචිත දේශන මාලාවක
- ලෝක ශ්වාසරෝගය පිළිබඳ දිනය 2024 මැයි 09 දිනට පවත්වන ලදී.
- 2024-06-02 දින එම ප්‍රදේශයේ අඩු වරප්‍රසාද සහිත පුද්ගලයින් සඳහා අක්ෂි කඳවුරක් වේයන්ගොඩ දී පවත්වන ලදී.
- 2024.10.09 දින රෝහල ආරම්භ කර වසර 25 සම්පූර්ණ වීම නිමිත්තෙන් සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පැවැත්වීම.

**2024 ලැබුණු පරිත්‍යාගයන්**

- 2024.07.05 දින ATG ආයතනය විසින් රුපියල් මිලියන 12.8ක් වටිනා Green Leaser Machine එකක් පරිත්‍යාග වශයෙන් රෝහලට ලැබුණි.

- අධ්‍යක්ෂ නීල් උමගිලිය මහතා විසින් රු.2,619,851.50 ක මුදලක් ශල්‍යාගාර ටයිල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා පරිත්‍යාග කරන ලදී.

- 2024 ජුලි සහ අගොස්තු මාසවලදී රු.2,555,931.99 ක් වටිනා මුදලක් ශල්‍යාගාරය ආශ්‍රිත ව්‍යාපෘතියක් (Theater Door Replacement) සඳහා පහත සඳහන් ආයතන වෙතින් පරිත්‍යාග කරන ලදී.

  - EMerchemie NB (Ceylon) LTD – Rs.1,000,000/00
  - George Steuart Health Pvt Ltd – Rs. 350,000/00
  - Lenstech Innovation Pvt Ltd – Rs.500,000/00
  - Dial Textile Industries Pvt Ltd – Rs.500,000/00
  - Hemas Pharmaceuticals (Pvt) ltd – Rs.1,000,000/00

- 2024 ජුලි මස අජිත් ඩයස් මහතා විසින් අඩු ආදායම්ලාභීන්ට කාච ලබාදීම වෙනුවෙන් රු.250,000/- ක මුදලක් පරිත්‍යාග කරන ලදී.

- Rotary Club of Colombo Metropolitan ආයතනය විසින් පහත සඳහන් වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,276,760/- ක මුදලක් පරිත්‍යාග කරන ලදී.
  - Retina Scopes – 03
  - Pulse Oximeter
  - Digital BP Meter
  - Fingertip Pulse Oximeter

නීල් උමගිලිය මයා සහ එච්.එච්.පී.අමරසේන මයා ඇතුළු තවත් කිහිපදෙනෙකු විසින් 2024 වසර සඳහා රු.35,000ක මුදලක් රෝහල වෙනුවෙන් පරිත්‍යාග කරන ලදී.

# මූල්‍ය වාර්තා

# 2024/12/31 දිනට

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

# සීදූව

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

| | | 2024 | 2023 (නැවත ප්‍රකාශ කරන ලදී) |
|---|---|---|---|
| **ආදායම** | | රුපියල් | රුපියල් |
| රජයේ ප්‍රදානය (පුනරාවර්තන) | | 456,800,000.00 | 403,200,000.00 |
| ක්‍රමක්ෂ ප්‍රාග්ධන ප්‍රදානය | | 23,213,279.24 | 22,483,420.64 |
| පරිත්‍යාග ක්‍රමක්ෂ කිරීම | | 4,697,257.42 | 5,364,357.56 |
| වෙනත් ආදායම් | 15 | 127,335,336.29 | 110,784,767.60 |
| **මුළු ආදායම** | | 612,045,872.95 | 541,832,535.80 |
| **වියදම්** | | | |
| වේතන වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 16 | 317,918,824.63 | 257,199,616.53 |
| භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය | 19 | 203,344,059.45 | 179,641,776.80 |
| ක්ෂය වීම | 17 | 27,910,536.66 | 27,847,778.20 |
| ක්ෂයවීම් නැවත තක්සේරු කළ වත්කම් | | 10,290,000.00 | 2,250,000.00 |
| වෙනත් වියදම් | 18 | 99,537,746.55 | 86,480,546.68 |
| **මුළු වියදම්** | | 659,001,167.29 | 553,419,718.21 |
| **කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය).** | | **(46,955,294.34)** | **(11,587,172.41)** |

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනට**

| | | 2024 | 2023 (නැවත ප්‍රකාශ කරන ලදී) |
|---|---|---|---|
| **වත්කම්** | | රුපියල් | රුපියල් |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල්වලට සමාන දේවල් | 1 | 3,746,003.08 | 6,619,238.71 |
| ලැබිය යුතු දේ | 2 | 18,562,652.08 | 16,886,586.01 |
| ඉන්වෙන්ටරි | 3 | 43,455,277.18 | 42,766,376.07 |
| පෙරගෙවුම් | 4 | 740,179.50 | 363,999.64 |
| | | 66,504,111.84 | 66,636,200.43 |
| ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය | 5 | 31,643,712.74 | 31,643,712.74 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ (WDV) | 6 | 101,587,107.51 | 93,397,764.43 |
| ඉඩම් සහ ගොඩනැගිලි (WDV) | 7 | 187,380,615.26 | 186,525,390.79 |
| | | 288,967,722.77 | 279,923,155.22 |
| **මුළු වත්කම්** | | 387,115,547.35 | 378,203,068.39 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු මුදල් | 8 | 14,017,238.14 | 13,614,869.10 |
| ණයහිමියන් | 9 | 199,334,096.53 | 169,815,329.37 |
| | | 213,351,334.67 | 183,430,198.47 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂිතය සඳහා ප්‍රතිපාදන | 10 | 60,340,465.62 | 53,728,397.07 |
| **මුළු වගකීම්** | | 273,691,800.29 | 237,158,595.54 |
| **ශුද්ධ වත්කම්** | | **113,423,747.06** | **141,044,472.85** |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | | |
| ප්‍රාග්ධන | 11 | 75,787,890.44 | 75,787,890.44 |
| රජයේ ප්‍රදානය - ප්‍රාග්ධන | 12 | 154,174,161.26 | 167,665,562.84 |
| පරිත්‍යාග කිරීම | 13 | 28,494,198.36 | 13,368,228.23 |
| සංචිත - ප්‍රාග්ධන ලාභය | | 2,131,366.30 | 2,131,366.30 |
| නැවත තක්සේරු කිරීමේ සංචිතය | | 40,200,000.00 | 22,500,000.00 |
| සමුච්චිත අතිරික්තයන් / (හිඟයන්) | 14 | (187,363,869.30) | (140,408,574.96) |
| මුළු ශුද්ධ වත්කම් / කොටස් | | **113,423,747.06** | **141,044,472.85** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

| | |
|---|---|
| ........................ | ........................ |
| චන්ද්‍රිකා කුමාරතුංග | එස්.ඒ.උමගිලිය |
| සභාපතිනි | අධ්‍යක්ෂක |
| අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩලය |
| විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල |
| දිනය : 18/02/2025 | දිනය : 18/02/2025 |
| ........................ | ........................ |
| වෛද්‍ය ඩී.පී.ඒ.රණවීර | පී.ඩී.වී.පී.එන්.බර්නාඩ් |
| අධ්‍යක්ෂ (වැඩ බලන) | ගණකාධිකාරි |
| විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල |
| දිනය : 18/02/2025 | දිනය : 17/02/2025 |

CHAIRPERSON
WIJAYA KUMAR...

DIRECTOR BOARD
WIJAYA KUMARATUNGA ...RIAL HOSPITAL

Accountant
Wijaya Kumarat... Hospital
Seeduwa

Director (... up)
Wijaya Kumaratunga Memorial Hospital
Seeduwa.

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | රුපියල් |
|---|---:|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| අතිරික්තය/(හිඟය) | (46,955,294.34) |
| <u>මුදල් නොවන ප්‍රවාහයන්</u> | |
| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම). | 38,200,536.66 |
| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම) (සමුච්චිත ක්ෂයවීම) | |
| ක්ෂය කිරීම | (27,910,536.66) |
| ගෙවිය යුතු මුදල් වැඩි වීම / (අඩු වීම). | 402,369.04 |
| ණය හිමියන්ගේ වැඩි වීම / (අඩු වීම). | 29,518,767.16 |
| භාණ්ඩ ලේඛනයේ වැඩි වීම / (අඩු වීම). | (688,901.11) |
| සේවක පිරිවැයට අදාළ ප්‍රතිපාදන වැඩි වීම / (අඩු වීම). | 6,612,068.55 |
| පෙරගෙවුම් වැඩි වීම / (අඩු වීම). | (376,179.86) |
| ලැබිය යුතු මුදල් වැඩි වීම / (අඩු වීම). | (1,676,066.07) |
| පැවරූ වත්කම්වල වටිනාකම අඩුවීමේ ප්‍රමාණය සහ මාරු කළ ස්ථාවර/වත්කම්වල ශුද්ධ වටිනාකම (වියදම් සඳහා අය කෙරේ) | 1.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | (2,873,235.63) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා එයි** | |
| පිරියත සහ උපකරණ මිල දී ගැනීම | (9,721,877.66) |
| සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු වැඩිවීම | - |
| ලැබුණු ප්‍රාග්ධන ආධාර | 9,721,877.66 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (0.00) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | |
| මුදල් හා සමාන මුදල්වලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම). | (2,873,235.63) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහමුදල්වලට සමාන දේ | 6,619,238.71 |
| කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දේ | 3,746,003.08 |

<u>**මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන්**</u>

| | |
|---|---:|
| මුදල් සහ මුදල්වලට සමාන දේ | |
| බැංකු ගත ඇති මුදල් | 2,221,411.07 |
| බැංකු ගත ඇති මුදල් - ප්‍රදාන | 858,272.01 |
| අතෙති මුදල් | 666,320.00 |
| | 3,746,003.08 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව**

**ශුද්ධ වත්කම් /කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

(සියල්ල ශ්‍රී ලංකා රුපියල් වලින්)

| | රජයේ ප්‍රදාන ප්‍රාග්ධනය | වෙනත් ආයතනවලින් ලබන ප්‍රාග්ධන | WKMH පදනම | BOI | UDA | සංචිත ප්‍රාග්ධන ලාභය | නැවත තක්සේරු කිරීමේ සංචිතය | ශුද්ධ අතිරික්තය / (හිගය) | මුළු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2024.01.01 දිනට ශේෂය | 167,665,562.84 | 13,368,228.23 | 29,632,139.32 | 28,155,751.12 | 18,000,000.00 | 2,131,366.30 | 22,500,000.00 | (140,408,574.96) | 141,044,472.85 |
| වසර තුළ PPE නැවත ඇගයීම | - | - | - | - | - | - | 17,700,000.00 | - | 17,700,000.00 |
| වර්ෂය තුළ ලැබුනු ප්‍රාග්ධන ප්‍රධානය | 9,721,877.66 | 19,823,227.55 | - | - | - | - | - | - | 29,545,105.21 |
| ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂ කිරීම | (23,213,279.24) | (4,697,257.42) | - | - | - | - | - | - | (27,910,536.66) |
| වර්ෂය ශුද්ධ අතිරික්තය / (හිගය) | - | - | - | - | - | - | - | (46,955,294.34) | (46,955,294.34) |
| වර්ෂය තුළ ගැලපීම | | - | - | - | - | - | - | - | - |
| 2024.12.31 දිනට ශේෂය.. | **154,174,161.26** | **28,494,198.36** | **29,632,139.32** | **28,155,751.12** | **18,000,000.00** | **2,131,366.30** | **40,200,000.00** | **(187,363,869.30)** | **113,423,747.06** |

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව

2024 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් කාලසටහන

(සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින්)

(Rs)

| අයිතම | 2024.01.01 වන විට පිරිවැය | වසර තුළ එකතු කිරීම | වසර තුළ බැහැර කිරීම | 2024.12.31 දිනට | අගය | 2024.01.01 වන විට | ක්ෂය වීම් එකතු කිරීම් අවුරුද්ද | වසර තුළ බැහැර කිරීම | 2024.12.31 වන විට | 2024.12.31 වන විට ලියාහරින ලද අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 27,159,873.50 | - | | 27,159,873.50 | | - | | | - | 27,159,873.50 |
| ගොඩනැගිලි සහ උපාංග | 220,529,625.95 | 5,310,067.55 | - | 225,839,693.50 | 2% | 61,164,108.66 | 4,454,843.08 | | 65,618,951.74 | 160,220,741.76 |
| වාහන | 31,000,000.00 | 9,200,000.00 | - | 40,200,000.00 | 20% | 10,749,999.00 | 10,290,000.00 | 8,499,999.00 | 12,540,000.00 | 27,660,000.00 |
| ගෘහභාණ්ඩ උපාංග සහ උපකරණ | 17,939,889.14 | 480,157.50 | | 18,420,046.64 | 10% | 11,074,427.27 | 1,199,608.77 | | 12,274,036.04 | 6,146,010.60 |
| යන්ත්‍රෝපකරණ | 31,672,316.63 | 711,470.00 | | 32,383,786.63 | 15% | 21,765,735.75 | 3,856,853.79 | | 25,622,589.54 | 6,761,197.09 |
| පරිගණක | 8,189,642.90 | 204,140.00 | | 8,393,782.90 | 20% | 5,728,683.63 | 1,060,789.30 | | 6,789,472.93 | 1,604,309.97 |
| වෛද්‍ය උපකරණ | 308,966,729.14 | 22,839,270.16 | - | 331,805,999.30 | 15% | 255,051,967.73 | 17,338,441.72 | | 272,390,409.45 | 59,415,589.85 |
| ධාරිතාව | - | | | - | 10% | | | | | |
| මුළු | 645,458,077.26 | 38,745,105.21 | - | 684,203,182.47 | | 365,534,922.04 | 38,200,536.66 | 8,499,999.00 | 395,235,459.70 | 288,967,722.77 |

| | |
|---|---|
| පරිත්‍යාග කිරීම | 19,823,227.55 |
| නැවත ඇගයීම | 9,200,000.00 |
| සැබෑ PPE එකතු කිරීම | 9,721,877.66 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව** (සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින්)

**ගිණුම් වෙත සටහන්**

| | | 2024 | 2023 ( නැවත සකස් කර ඇත) |
|---|---|---|---|
| **මුදල් සහ මුදල්වලට සමාන දේ** | 1 | | |
| බැංකුගත මුදල් | | 2,221,411.07 | 6,527,058.71 |
| බැංකුගත මුදල් - පරිත්‍යාග කිරීම | | 858,272.01 | - |
| සුළු මුදල් | | - | - |
| අතැති මුදල් | | 666,320.00 | 92,180.00 |
| | | 3,746,003.08 | 6,619,238.71 |
| **ලැබිය යුතු දේ** | 2 | | |
| තැන්පතු ගිණුම | | 395,429.10 | 395,429.10 |
| උත්සව අත්තිකාරම් | | 273,750.00 | 303,750.00 |
| විශේෂ අත්තිකාරම් | | - | - |
| ලැබිය යුතු - ආපනශාලා සහ කිරිහල | | 95,600.00 | 98,600.00 |
| නැවත ලබා ගත හැකි - අතුරු සහ භාෂා දීමනා | | | 147,404.00 |
| කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් අයකර ගත හැකිය (නොගෙවීම් ආදිය) | | 196,560.00 | 4,964.51 |
| කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් අයකර ගත හැකි (බැඳුම්කර ආදිය) | | 2,755,715.93 | 2,185,557.00 |
| ලැබිය යුතු Covid මධ්‍යස්ථානය | | 2,249,167.05 | 2,249,167.05 |
| ආපදාණය | | 12,596,430.00 | 11,501,714.35 |
| | | 18,562,652.08 | 16,886,586.01 |
| **ඉන්වෙන්ටරි** | 3 | | |
| ස්ථාවර | | 749,680.99 | 641,208.47 |
| ඖෂධ | | 38,122,844.74 | 39,023,785.91 |
| රසායනාගාර රසායන | | 3,147,504.22 | 2,203,432.43 |
| ලිනන් භාණ්ඩ | | 230,279.39 | 124,878.54 |
| පොදු ගබඩාව | | 832,864.56 | 514,359.59 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව | | 150,280.40 | 111,678.50 |
| එක්ස් කිරණ | | 219,642.08 | 102,720.64 |
| දන්ත වෛද්‍ය | | 2,180.80 | 44,311.99 |
| | | 43,455,277.18 | 42,766,376.07 |
| **පෙරගෙවුම්** | 4 | | |
| වෛද්‍ය උපකරණ සේවා ගිවිසුම | | 252,009.34 | 123,931.77 |
| ෆැක්ස්, අනුපිටපත් MC ආදිය සමඟ සේවා ගිවිසුම් | | 43,603.64 | 8,510.01 |
| බලපත්‍ර / රක්ෂණ අලුත් කිරීම | | 95,699.86 | 147,420.36 |
| QB පද්ධති නඩත්තු/ වැටුප් ගෙවීම | | 12,500.00 | 27,500.00 |
| සෝපානයේ සේවා ගිවිසුම | | 278,251.66 | |
| විදුලිජනක සේවා කිරීම | | 58,115.00 | 56,637.50 |
| | | 740,179.50 | 363,999.64 |
| **ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය** | 5 | | |
| වැඩ ප්‍රගතිය - නව ගොඩනැගිලි කාර්යාලය | | 662,076.27 | 662,076.27 |
| වැඩ ප්‍රගතිය - නව ගොඩනැගිලි 2 | | 30,981,636.47 | 30,981,636.47 |
| | | 31,643,712.74 | 31,643,712.74 |
| **යටිතල පහසුකම්, කර්මාන්තශාලා සහ උපකරණ** | 6 | | |
| යන්ත්‍රෝපකරණ | | 6,761,197.09 | 9,906,580.88 |
| ගෘහභාණ්ඩ | | 6,146,010.60 | 6,865,461.87 |
| වාහන | | 27,660,000.00 | 20,250,001.00 |
| පරිඝණක | | 1,604,309.97 | 2,460,959.27 |
| වෛද්‍ය උපකරණ | | 59,415,589.85 | 53,914,761.41 |
| | | 101,587,107.51 | 93,397,764.43 |
| **ඉඩම් සහ ගොඩනැගිලි** | 7 | | |
| ඉඩම් | | 27,159,873.50 | 27,159,873.50 |
| ගොඩනැගිලි සහ උපාංග | | 160,220,741.76 | 159,365,517.29 |
| | | 187,380,615.26 | 186,525,390.79 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව** (සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින්)

**ගිණුම් වෙත සටහන්**

| | | 2024 | 2023 ( නැවත සකස් කර ඇත) |
|---|---|---|---|
| **උපචිත වියදම්** | 8 | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | 842,000.00 | 801,456.00 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | | 1,975,812.86 | 2,196,294.54 |
| ගෙවිය යුතු දුරකථන / වෙබ් අඩවි ගාස්තු | | 37,686.15 | 27,382.35 |
| ගෙවිය යුතු ඉන්ධන | | 88,088.00 | 51,716.00 |
| ගෙවිය යුතු යැපුම් | | | 5,450.00 |
| ගෙවිය යුතු නීතිඥ ගාස්තු | | | 80,000.00 |
| ගෙවිය යුතු රසායනාගාර රසායන | | | 1,780,390.52 |
| ගෙවිය යුතු බිල්පත් සහ නඩත්තුව - වෛද්‍ය උපකරණ | | 263,593.77 | 69,547.34 |
| මණ්ඩල ලේකම්වරයාට ගෙවිය යුතු දීමනාව | | 35,000.00 | 35,000.00 |
| ගෙවිය යුතු අපද්‍රව්‍ය කළමනාකරණ බිල්පත් | | 258,724.44 | 247,990.24 |
| TEC / ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයින්ට ගෙවිය යුතු දීමනාව | | 178,000.00 | - |
| ගෙවිය යුතු WHT | | 7,568.25 | - |
| ගෙවිය යුතු බිල්පත් සහ නඩත්තු කිරීම - ගොඩනැගිල්ල | | | 61,453.51 |
| | | 3,686,473.47 | 5,356,680.50 |
| **ගෙවිය යුතු මුදල්** | | | |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතුව | | 155,200.00 | 195,900.00 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් | | 447,900.40 | 413,419.10 |
| ගෙවිය යුතු පාරිතෝෂිකය | | 759,993.76 | 1,276,659.38 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | | | 50.00 |
| සුභසාධක සංගමයට / කතෝලික සංගමයට ගෙවිය යුතු මුදල | | | 700.00 |
| දීමනා සහ අනෙකුත් වැටුප් ආශ්‍රිත ගෙවීම් | | | 293.54 |
| කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප | | 2,923,912.50 | 583,708.25 |
| බාහිර වෛද්‍යවරුන් සඳහා ගෙවිය යුතු දීමනාව | | 671,658.57 | 418,615.41 |
| ගෙවිය යුතු අවදානම් දීමනාව | | 8,400.00 | 2,800.00 |
| පුහුණුවන්නන් සඳහා ගෙවිය යුතු දීමනාව | | 44,070.00 | 41,600.00 |
| වෙනත් ගෙවීම් | | 15,000.00 | |
| ගෙවිය යුතු EPF ETF | | | 25,464.67 |
| ගෙවිය යුතු අතිකාල & PH දීමනා | | 5,304,629.44 | 5,298,978.25 |
| | | **10,330,764.67** | **8,258,188.60** |
| | | 14,017,238.14 | 13,614,869.10 |
| **ණය හිමියන්** | 9 | | |
| SPC | | - | - |
| MSD | | 159,269,184.95 | 131,669,487.89 |
| නලින් තුෂාර / පනාගොඩ | | 389,670.00 | 154,577.00 |
| Star Cleaners | | | - |
| Sudeena Suppliers | | 3,996,393.85 | 2,387,149.00 |
| Industrial Gas | | 13,218.08 | 9,221.01 |
| Swastha Environmental | | - | 3,454,922.34 |
| Super Will Shilne | | 3,701,569.96 | - |
| ලංකා ධීවර සංස්ථාව | | 190,000.00 | 443,103.55 |
| LRDC ආරක්ෂක සේවය | | 792,423.22 | 715,232.11 |
| CECB | | 30,981,636.47 | 30,981,636.47 |
| | | 199,334,096.53 | 169,815,329.37 |
| **සංචිත** | 10 | | |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | | 60,340,465.62 | 53,728,397.07 |
| | | 60,340,465.62 | 53,728,397.07 |
| **ප්‍රාග්ධන සහ සංචිත** | 11 | | |
| විජය කුමාරතුංග අනුස්මරණ පදනම | | 29,632,139.32 | 29,632,139.32 |
| ආයෝජන මණ්ඩලය | | 28,155,751.12 | 28,155,751.12 |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 18,000,000.00 | 18,000,000.00 |
| | | 75,787,890.44 | 75,787,890.44 |
| **රජයේ ප්‍රදානය සහ ප්‍රාග්ධනය** | 12 | | |
| 01/01 වන විට | | 167,665,562.84 | 190,148,983.48 |
| වසර තුල එකතු කිරීම | | 9,721,877.66 | - |
| ක්ෂය කිරීම | | 23,213,279.24 | 22,483,420.64 |
| 12/31 වන විට | | 154,174,161.26 | 167,665,562.84 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව** **(සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින්)**

**ගිණුම් වෙත සටහන්**

| | | 2024 | 2023 ( නැවත සකස් කර ඇත) |
|---|---|---|---|
| **<u>පරිත්‍යාග කිරීම</u>** | 13 | | |
| ඉදිරියට ගෙනා ශේෂය | | 13,368,228.23 | 18,193,897.81 |
| කාල සීමාව සඳහා පරිත්‍යාග කිරීම | | 19,823,227.55 | 538,687.98 |
| පරිත්‍යාග කරන ලද වත්කම් ක්‍රමක්ෂ කිරීම | | 4,697,257.42 | 5,364,357.56 |
| | | 28,494,198.36 | 13,368,228.23 |
| **සමුච්චිත හිඟය** | 14 | | |
| 31/12 වන විට ඉදිරියට ගෙනා ශේෂය | | (140,408,574.96) | (128,821,402.55) |
| කාල සීමාව සඳහා අතිරික්තය | | (46,955,294.34) | (11,587,172.41) |
| | | (187,363,869.30) | (140,408,574.96) |
| **<u>වෙනත් ආදායම්</u>** | 15 | | |
| පෞද්ගලික වෛද්‍ය සහතික ගාස්තු | | 208,400.00 | 196,920.00 |
| විවිධ ආදායම් | | 2,410,251.07 | 5,553,564.12 |
| ටෙන්ඩර් තැන්පතුව - ආපසු ගෙවිය නොහැකි | | 276,500.00 | 266,000.00 |
| ආපදා ණය පොලිය | | 515,489.27 | 522,890.68 |
| අක්ෂි සැත්කම් ගාස්තු - ප්‍රධාන | | 79,343,900.00 | 55,095,950.00 |
| අක්ෂි සැත්කම් ගාස්තු - සුළු | | 1,105,500.00 | 797,300.00 |
| සාමාන්‍ය මෙහෙයුම - ප්‍රධාන / අතරමැදි | | 4,639,000.00 | 5,540,500.00 |
| සාමාන්‍ය මෙහෙයුම - සුළු | | 3,735,040.00 | 3,659,100.00 |
| පොලිය - විශේෂ. අත්තිකාරම් | | 8,732.00 | 9,042.80 |
| FFA | | 4,500.00 | 43,500.00 |
| FLT | | 58,500.00 | 88,500.00 |
| Peripheral | | 39,000.00 | - |
| YAG PI | | 16,500.00 | 48,000.00 |
| PRP | | 53,000.00 | 729,500.00 |
| YAG CAPSULOMY | | 498,000.00 | 446,250.00 |
| OCT | | 4,327,350.00 | 4,059,000.00 |
| | | 7,400.00 | 7,650.00 |
| Upper GI | | 228,000.00 | 208,000.00 |
| Sigmad copy | | 536,000.00 | 816,000.00 |
| Colonoscopy | | 187,500.00 | 330,000.00 |
| Duplex | | 1,744,400.00 | 1,454,250.00 |
| Breast | | - | - |
| Lipid Profile | | 916,440.00 | 1,113,300.00 |
| PRP injection | | 796,000.00 | 782,250.00 |
| Biopsy | | 143,500.00 | 168,000.00 |
| Grid | | - | 1,500.00 |
| සෞඛ්‍ය පැකේජය | | - | - |
| වෙනත් පරිත්‍යාග | | 944,783.95 | - |
| MP Injuction | | 231,000.00 | 266,000.00 |
| HBA1C | | 2,400.00 | 171,000.00 |
| Lid Laser | | 1,500.00 | - |
| | | - | - |
| USS Guided Sele | | 781,000.00 | 782,250.00 |
| Barrier Laser | | - | - |
| Proctoscopy | | - | - |
| සායන එකතු කිරීම | | 23,575,750.00 | 27,628,550.00 |
| | | 127,335,336.29 | 110,784,767.60 |
| **<u>වියදම්</u>** | 16 | | |
| **<u>වැටුප්, වැටුප් සහ සේවක ප්‍රතිලාභ</u>** | | | |
| **<u>වැටුප් සහ දීමනා</u>** | | | |
| වැටුප් සහ දීමනා - වෛද්‍ය නිලධාරින් | | 62,337,553.24 | 43,789,508.04 |
| වැටුප් සහ දීමනා - වෙනත් කාර්ය මණ්ඩලය | | 19,751,303.76 | 19,831,911.54 |
| වැටුප් සහ දීමනා - පරිපූරක වෛද්‍ය | | 15,587,032.87 | 12,456,530.01 |
| වැටුප් සහ දීමනා - හෙදියන් | | 73,796,548.46 | 58,522,867.15 |
| වැටුප් සහ දීමනා - සුළු කාර්ය මණ්ඩලය | | 44,142,753.31 | 37,110,876.44 |
| අර්ථසාධක අරමුදල් 12% | | 20,930,327.59 | 16,928,144.58 |
| රැකියා භාර අරමුදල් 3% | | 5,232,582.66 | 4,232,037.50 |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව** (සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින්)

**ගිණුම් වෙත සටහන්**

| | | 2024 | 2023 ( නැවත සකස් කර ඇත) |
|---|---|---|---|
| අර්ථසාධක අරමුදල් අධිභාරය | | - | - |
| අමතර රාජකාරී ගෙවීම් - වෛද්‍ය නිලධාරීන් | | 25,406,443.85 | 23,089,415.34 |
| අතිකාල - අනෙකුත් කාර්ය මණ්ඩලය | | 5,138,563.43 | 5,301,878.46 |
| අතිකාල - පරිපූරක වෛද්‍ය | | 4,051,180.33 | 3,944,508.67 |
| අතිකාල - හෙද නිලධාරීන් | | 18,656,879.94 | 16,987,143.30 |
| අතිකාල - සුළු කාර්යය මණ්ඩලය | | 10,568,621.00 | 9,816,218.05 |
| පාරිතෝෂිත වියදම | | 12,319,034.19 | 5,188,577.45 |
| | | 317,920,848.63 | 257,199,616.53 |
| **ක්ෂය වීම** | 17 | | |
| ගොඩනැගිලි සහ උපාංග | | 4,454,843.08 | 4,398,865.84 |
| ගෘහ භාණ්ඩ, සවි කිරීම සහ උපකරණ | | 1,199,608.77 | 915,308.29 |
| | | 3,856,853.79 | 3,669,317.72 |
| පරිගණක | | 1,060,789.30 | 1,138,596.63 |
| වෛද්‍ය උපකරණ | | 17,338,441.72 | 15,815,686.72 |
| වාහන | | 10,290,000.00 | 8,660,003.00 |
| | | 38,200,536.66 | 34,597,778.20 |
| **ගමන් වියදම්** | 18 | | |
| යැපුම් දීමනා | | 333,412.00 | 128,739.50 |
| ප්‍රවාහන වියදම | | 77,632.00 | 115,760.00 |
| **නඩත්තු වියදම** | | | |
| විදුලි | | 24,698,467.87 | 22,344,186.27 |
| ජලය | | 2,950,701.65 | 2,060,532.29 |
| දුරකථන | | 439,412.76 | 393,802.04 |
| තැපැල් ගාස්තු | | 140,620.00 | 92,240.00 |
| **අලුත්වැඩියාව සහ නඩත්තුව** | | | |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - ගොඩනැගිලි | | 4,347,330.63 | 3,557,638.55 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - යන්ත්‍රෝපකරණ | | 4,319,609.57 | 3,540,819.84 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - වාහන | | 2,273,560.09 | 1,660,842.16 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - පරිඝණක | | 470,216.02 | 463,181.48 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - වෛද්‍ය උපකරණ | | 8,836,686.44 | 5,447,773.91 |
| අළුත්වැඩියාව සහ නඩත්තුව - ගෘහභාණ්ඩ | | - | 11,100.00 |
| **කොන්ත්‍රාත් සේවාව** | | | |
| පිරිසිදු කිරීම | | 14,356,834.44 | 14,372,703.30 |
| රෙදි සෝදන | | 5,675,480.00 | 2,085,465.00 |
| ආරක්ෂක | | 8,867,278.89 | 8,116,243.10 |
| ආහාර සැපයීම | | 11,285,549.16 | 12,304,913.96 |
| මණ්ඩල සමාජික ගාස්තු සහ විගණන කොමිස් ගාස්තු | | 286,000.00 | 114,000.00 |
| ලේකම් ගාස්තු | | 420,000.00 | 420,000.00 |
| විවිධ වියදම් | | 297,184.00 | 384,966.94 |
| වෙළඳ දැන්වීම | | 713,304.00 | 1,408,556.70 |
| වෙනත් බැංකු ගාස්තු | | 98,731.05 | 69,830.00 |
| විගණන ගාස්තු | | 842,000.00 | 801,456.00 |
| නීතිඥ ගාස්තු | | 15,000.00 | 397,000.00 |
| කුලියට දීම | | - | 242,728.69 |
| Generator සඳහා ඉන්ධන | | 488,400.00 | 663,900.00 |
| ආහාර පිරිවැය | | 229,997.00 | 194,367.00 |
| ලිපිද්‍රව්‍ය සහ දෘඩාංග අයිතම | | 422,365.40 | 237,696.90 |
| NAITA පුහුණුකරුවන් | | 474,190.00 | 372,725.00 |
| අපද්‍රව්‍ය කළමනාකරණය | | 2,912,452.84 | 1,490,853.24 |
| ඉන්ධන - වාහන | | 2,858,720.50 | 2,520,650.50 |
| රක්ෂණය | | 232,820.12 | 220,262.88 |
| ලියාපදිංචි / බලපත්‍ර ගාස්තු | | 30,953.11 | 37,619.43 |
| පුහුණු වැඩසටහන් | | 53,000.00 | 62,000.00 |
| බලපත්‍ර ගාස්තු වෙනත් | | 89,837.01 | 145,992.00 |
| | | 99,537,746.55 | 86,480,546.68 |

(සියල්ල ශ්‍රී ලංකා රුපියල්වලින් )

| සැපයුම් පරිභෝජනය | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2024.01.01 දිනට ආරම්භක තොගය | මිලදී ගැනීම් මත 2024 | 2024.12.31 දිනට අවසන් තොගය | 2024 වසර සඳහා පරිභෝජනය | 2023.12.31 දිනට ආරම්භක තොගය | මිලදී ගැනීම් මත 2023 | 2023.12.31 දිනට අවසන් තොගය | 2023 වසර සඳහා පරිභෝජනය |
| රසායනාගාර රසායන | 2,203,432.43 | 7,729,398.16 | 3,147,504.22 | 6,785,326.37 | 4,329,026.46 | 6,296,817.58 | 2,203,432.43 | 8,422,411.61 |
| එක්ස්-රේ පටල සහ රසායනික ද්‍රව්‍ය | 102,720.64 | 496,229.57 | 219,642.08 | 379,308.13 | 60,150.13 | 764,910.94 | 102,720.64 | 722,340.43 |
| ඖෂධ | 39,023,785.91 | 184,011,057.16 | 38,122,844.74 | 184,911,998.33 | 29,989,710.18 | 168,329,558.38 | 39,023,785.91 | 159,295,482.65 |
| ලිනන් භාණ්ඩ | 124,878.54 | 989,700.00 | 230,279.39 | 884,299.15 | 240,793.54 | 537,870.00 | 124,878.54 | 653,785.00 |
| පාරිභෝගික සහ සාමාන්‍ය ගබඩා භාණ්ඩ | 514,359.59 | 2,459,563.21 | 832,864.56 | 2,141,058.24 | 922,817.47 | 2,033,429.85 | 514,359.59 | 2,441,887.73 |
| ලිපිද්‍රව්‍ය | 641,208.47 | 1,895,511.48 | 749,680.99 | 1,787,038.96 | 886,738.82 | 1,968,046.00 | 641,208.47 | 2,213,576.35 |
| අලුත්වැඩියාව සහ නඩත්තුව (ii) | 111,678.50 | 1,308,270.85 | 150,280.40 | 1,269,668.95 | 173,495.50 | 950,539.00 | 111,678.50 | 1,012,356.00 |
| දන්ත පරිභෝජනය | 44,311.99 | 421,762.88 | 2,180.80 | 463,894.07 | 35,485.99 | 128,500.00 | 44,311.99 | 119,674.00 |
| | 42,766,376.07 | 199,311,493.31 | 43,455,277.18 | 198,622,592.20 | 36,638,218.09 | 181,009,671.75 | 42,766,376.07 | 174,881,513.77 |

| සැපයුම් පරිභෝජනය | 19 | | |
|---|---|---|---|
| රසායනාගාර රසායන | | 6,785,326.37 | 8,422,411.61 |
| එක්ස්-රේ පටල සහ රසායනික ද්‍රව්‍ය | | 379,308.13 | 722,340.43 |
| ඖෂධ | | 184,911,998.33 | 159,295,482.65 |
| ලිනන් භාණ්ඩ | | 884,299.15 | 653,785.00 |
| පාරිභෝගික සහ සාමාන්‍ය ගබඩා භාණ්ඩ | | 2,141,058.24 | 2,441,887.73 |
| ලිපිද්‍රව්‍ය | | 1,787,038.96 | 2,213,576.35 |
| අලුත්වැඩියාව සහ නඩත්තුව (ii) | | 1,269,668.95 | 1,012,356.00 |
| දන්ත පරිභෝජනය | | 463,894.07 | 119,674.00 |
| පාරිභෝගික වෛද්‍ය උපකරණ | | 4,161,101.57 | 4,288,905.00 |
| Gas | | 560,365.68 | 471,358.03 |
| | | 203,344,059.45 | 179,641,776.80 |

**විභාග වෙමින් පවතින අධිකරණ නඩු** 20

1. වෛද්‍ය වසන්ත කුමාර ගමගේ විසින් විජය කුමාරතුංග රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නඩු පවරන ලදී.
අධිකරණ නඩුව තවමත් ක්‍රියාත්මක වන බැවින් , මෙම තත්ත්වයේදී ගෙවිය යුතු අධික්ෂණ වටිනාකම හඳුනාගත නොහැක.

2. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආචාර්ය එන්.පී.ඒ. ද සිල්වාට එරෙහිව නඩු පවරන ලදී
- නඩුව ගොනු කර ඇත, තවමත් කැඳවා නොමැත.

3. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් M.A.D. රුවන් පුෂ්පකුමාර මහතාට (හිටපු කැන්ටින් හිමිකරු) එරෙහිව නඩු පවරන ලදී.
නඩුව ගොනු කර ඇත, තවමත් කැඳවා නොමැත.

**අක්ෂි සංයන විදුලි වැඩ සඳහා සුනිල් කන්ස්ට්‍රක්ෂන් සහ CECB වෙත ගෙවිය යුතුය.**

අක්ෂි සංයනයේ වෙනස් කිරීම 2020 දී ප්‍රාග්ධන ගොඩනැගිලි කාර්යයක් ලෙස සිදු කරන ලදී. විදුලි වැඩ සඳහා වන අවසාන පහත් කෙටුම්පත
කිසියම් හේතුවක් නිසා මෙම වෙනස් කිරීම එම කාල පරිච්ඡේදයේදී CECB විසින් අනුමත නොකළ බැවින් අවසාන බිල්පත රු. 1,185,766.56 කි.
සුනිල් කන්ස්ට්‍රක්ෂන් සඳහා සහ CECB සඳහා ඔවුන්ගේ උපදේශන ගාස්තු සඳහා ගෙවිය යුතු රු. 83,452.66 ක මුදල ගිණුම්ගත කර නොමැත.

# සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

**පොදු**

**සැකසීමේ පදනම**

1.1.1 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

1.1.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකසා ඇත.

1.1.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකසා ඇත.

## රාජ්‍ය ප්‍රදාන

1.2 මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන වර්ග දෙකකින් ලැබේ. ඒවා නම්

ප්‍රාග්ධන ප්‍රදාන

**පුනරාවර්තන** ප්‍රදාන

1.2.1 ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව ගණනය කෙරේ. ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්වල භාවිත ආයුකාලය පදනම කරගත් ආදායමක් ලෙස හඳුනාගන්නා විලම්බිත ආදායම් (වාර්ෂිකව ක්ෂයවන වත්කම් වටිනාකම වසරේ ආදායමක් ලෙස ගණන් ගැනේ) ක්‍රමය තුල පිළිගැනේ.

1.2.2 පුනරාවර්තන ප්‍රධාන අදාල කාලය තුල ආදායමක් ලෙස හඳුනා ගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

## 1.3 බදු අයකිරීම්

අදාළ වසර තුල ඌනතාවයක් ලබා ඇති හෙයින් මණ්ඩලය බදු සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

මණ්ඩලය නිරතුරව ගිණුම් ප්‍රතිපත්ති අනුව පූර්ව වසර වල අගයන් සලකමින් කටයුතු කර ඇත.

2. **වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම**

## 2.1 දේපල, පිරියත හා උපකරණ අගය ක්ෂයවීම් හා ප්‍රතිඇගයුම

2.1.1 දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකර ඇගයුමට දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු ඒවා ඉදිකිරීම් මිලදී ගැනීමේ පිරිවැය සමඟ වත්කම් අපේක්ෂිත භාවිතාව සඳහා පත් කිරීමට අදාළව කළ අතුරු වියදම් ඇතුළත් වේ.

සේවා ලබා දීමට හැකි වන පරිදි හෝ සේවා ධාරිතාවය වැඩිකරලීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදු කළ ස්ථාවර තත්වයේ යුතු වත්කම් වැඩිදියුණු කිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා කළ වියදම් **මූලධන වියදම් වශයෙන් සලකනු ලැබේ.**

2.1.2 සින්නක්කර ඉඩම් හැර වත්කම් පහත දැක්වෙන අනුපාතයට සෘජු රේඛීය ක්‍රමය භාවිතා කර **පහත සඳහන් ප්‍රමාණයන්ට ක්ෂය වීම් ගණන් බලා ඇත.**

| | |
|---|---|
| ගොඩනැගිලි හා සවිකිරීම් | 2% |
| වාහන | 20% |
| ලීබඩු, සවිකිරීම් හා උපකරණ | 10% |
| යන්ත්‍රෝපකරණ | 15% |
| වෛද්‍ය උපකරණ | 15% |
| පරිඝණක | 20% |

2.1.3 මිලදී ගත් වසරට හා මිලදී ගැනීමට අදාලව **ක්ෂය** දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසරේ කිසිදු ක්ෂය දැක්වීමක් කර නොමැත.

2.1.4 මුලා ගලන ප්‍රකාශය තුල මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් හා බැංකුගත මුදල් ඇතුළත් වේ.

**3. බැරකම් හා ප්‍රතිපාදන**

**3.1 ප්‍රාග්ධන බැදීම් හා අවිනිශ්චිත බැරකම්**

ශේෂපත්‍ර දිනට වූ සියළු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන **බැදීම්** වියදම් වෙන්කිරීම් හා **අවිනිශ්චිත** බැරකම් ගිණුම් සටහන් වල දක්වා ඇත.

**3.2 වට්ටෝරු භාණ්ඩ / තොග ඇගයුම**

තොග පිරිවැයට ඇගයුම් කර ඇත.

**4. ආදායම් හා වියදම්**

**4.1 ආදායම්**

4.1.1 මණ්ඩලයේ ආදායම් තුල පුද්ගලික වෛද්‍ය සහතික හා රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සහ විවිධ ආදායම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

4.1.2 සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

**4.2 වියදම**

රෝගී ප්‍රතිකාර ලබා දීමට හා ප්‍රාග්ධන වත්කම් සක්‍රිය ලෙස නඩත්තු කරලීමට අදාල සියළු වියදම් වසරේ අතිරික්තය හෝ හිගය ගණනය කිරිමේ දී උපචිත පදනම මත ආදායමට බැර කර ඇත.

ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යසාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ව පැහැදිලි වන ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විඑච්ඕ/එෆ්/ඩබ්කේඑම්එච්/1/24/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 20 දින

Wijaya Kumaratunga Memorial Hospital
29 MAY 2025
6
SEEDUWA

සභාපති

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

පිටපත් 01- ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය

02 - ලේකම්, මුදල් හා ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. THO/F/WKMH/1/24/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 20 දින

සභාපති,
විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) භාවිතයෙන් ඉවත් කරන ලද රු.256,724 ක් වූ ඖෂධවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල නොගැලපීම හේතුවෙන් පාරභෝජන ද්‍රව්‍ය පිරිවැය හා අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 22 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් සඳහා දරණ ලද වියදමින් වත්කමෙහි අගය වැඩිවීමක් සිදුවේ නම් එම අගය ප්‍රාග්ධනිත කල යුතු වුවද ඉන් බැහැරව වෛද්‍ය උපකරණ අළුත්වැඩියා වියදම් රු.4,078,788ක් අයභාර වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩියෙන් හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව, සම්පූර්ණයෙන්ම ක්ෂයකර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 215,473,265ක් වූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ප්‍රකාරව ඵලදායි ජීව කාලය නැවත සමාලෝචනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ හිමිකාරිත්වය යටතේ පවතින වාහන 05ක් 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ අතර ඉන් රු.මිලියන 8.5ක පිරිවැය වූ වාහනයක් රු.මිලියන 17.7කට අගය කර තිබුණි. මෙම ප්‍රත්‍යාගණිත අගය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කිරීමෙන් තොරව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනතුල ප්‍රත්‍යාගණිත අගයට වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් 2024 වර්ෂය ආරම්භයේදී දේපල පිරියත උපකරණ වල වටිනාකම රු. මිලියන 9.2ක් අඩුවෙන් දැක්වුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව සටහන් මගින් මෙය හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.60,892,587ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.60,340,465 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම නොවන වගකීම්, පාරිතෝෂික වියදම හා වර්ෂයේ අලාභය රු.552,122 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අතිරික්තව පැවති භාණ්ඩ වර්ග 03ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2018 වර්ෂයේ සිට ලැබිය යුතු සායනික අපද්‍රව්‍ය බැහැර කරන කහ වර්ණයේ පොලිතීන් බෑග් පිටතින් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු.328,771 ක මුදල මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. එම මුදල සමාගමෙන් අයකර ගන්නා ලෙස 2022 නොවැම්බර් 11 දින පැවති රජයේ ගිණුම් කාරක සභාව විසින්ද නියෝග කර තිබිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

2

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇතිබව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා විධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර අත්පොත 3.2.ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙළ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙළ කර නොතිබුණි. |

4

| | |
|---|---|
| (ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද, මණ්ඩලයේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි . |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2022 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.4.1 ප්‍රකාරව, හදිසි හා අත්‍යාවශ්‍ය මිලදීගැනීම් අවස්ථාවක හැර තාක්ෂණික ඇගයීම් කමිටුවක සෞඛ්‍ය අමාත්‍යාංශයේ, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ, මහා භාණ්ඩාගාරයේ, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ, වසංගත රෝග විද්‍යා ඒකකයේ නියෝජිතයෙකු සහ අවම විශේෂඥතාවක් සහිත උපදේශකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවද රෝහල විසින් අවස්ථාගත 22 කදී රු. 34,387,771 ක්වූ ඖෂධ හා උපාංග මිලදී ගැනීමේදී එවැනි නියෝජනයක් සහිත කමිටුවක් පත් කර නොතිබුණි.

(ආ) රුධිරයේ සීනි මට්ටමේ ඉතිහාසය (History) පරීක්ෂා කිරීම සඳහා 2021 වර්ෂයේ දී රු.4,800,000කට මිලදී ගෙන රසායනාගාරයේ ස්ථාපිත කරන ලද HbA,C Analyzer යන්ත්‍රයේ පරීක්ෂණ සිදු කිරීමට යෙදිය යුතු ප්‍රතික්‍රියක (Reagent) සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 06 දින සිට ක්‍රියාත්මක කර නොතිබුණි. එම යන්ත්‍රයේ පිරිවිතර (Specification) අනුව අවම වශයෙන් සතියකට වරක් On/Off කළ යුතු වුවද වර්තමානය වන විට පරීක්ෂණ කටයුතු සඳහා යොදවා නොගැනීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. යන්ත්‍රය දිගුකලක් නිශ්කාර්යව පැවතීම නිසා නැවත ක්‍රියාත්මක කිරීමට Capilary අටක් අළුතින් සවි කිරීමට අවශ්‍ය බව ද එක් ඒකකයක් රු.250,000 ක් බැගින් ඒකක 08 ක් අවශ්‍ය වන බවද අනාවරණය විය. මෙම යන්ත්‍රය මිලදී ගැනීමට පෙර අදාල ප්‍රසම්පාදනයේදී අවශ්‍ය ප්‍රතික්‍රියක මිල පිළිබඳ අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් මත කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් 2022 වර්ෂයේදී වැයකරන ලද රු.2,249,167ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ සිට හිඟහිටි රු.95,600 ක ආපන ශාලා කුලිය අයකරගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත සේවකයින්ගේ දෛනික පැමිණීමේ ලේඛන පරීක්ෂාවේදී කාන්තාවන් දෙදෙනෙකු එකම අත්සන භාවිතා කරන බව හා එක් අයෙකු නොමැතිනම් අනික් සේවිකාවගේ අත්සනද නොමැති බව දක්නට ලැබුණි. 2025 මාර්තු මස 24 , 25 හා 26 යන දිනයන්හිදී සිදුකළ භෞතික පරීක්ෂාවේදී ව්‍යාජ නම් හා හැඳුනුම්පත් අංක දෙකක් යොදා ගෙවීම් ලබාගෙන ඇති බව තහවුරු විය. ඒ අනුව දෛනික සේවයේ යොදවන සේවකයින්ගේ ලැයිස්තුව සනාථ කිරීමේදී කලමනාකරණය විසින් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයේ ගෙවීම්වල පැවති ව්‍යාජ නමින් ඇති පුද්ගලයින් හඳුනාගෙන සිදුකර ඇති ගෙවීම් නැවත අදාළ ආයතනයෙන් හෝ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අය කරගත යුතු විය.

(ඈ) එන්ඩොස්කොපි ඒකකය මගින් UGIE සහ LGIE පරීක්ෂණ දෙක සිදුකරන අතර ඒ සඳහා මණ්ඩලයේ පූර්ණ කාලීන වෛද්‍යවරයෙකු නොමැතිවීමෙන් එක් වෛද්‍යවරයෙකු විසින් සතියකට එක් දිනක් පමණක් මෙම ඒකකයේ පරීක්ෂණ සිදුකරනු ලබයි. එක් පරීක්ෂණයක් සඳහා රු.4,000 ක පමණ මුදලක් අයකරන අතර 2025 මාර්තු වන විට රෝගීන් 160ක් පමණ පොරොත්තු ලේඛනය තුල සිටීම හේතුවෙන් රෝහලට උපයාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබූ අතර රෝගීන්ගේ පරීක්ෂණ කටයුතුද ප්‍රමාද වී තිබුණි..

(ඉ) මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු රු.30,981,636 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද මෙම වියදම මණ්ඩලයේ යෝජිත වාට්ටු සංකීර්ණයේ ව්‍යුහාත්මක සැලසුම් ඇඳීම වෙනුවෙන් 2019 වර්ෂයට අදාල වියදමක් විය. වර්තමානය වන විට මූලික සැලසුම ඇඳීමේ කටයුතු හැර අනෙකුත් කිසිදු කාර්යක් සිදු නොකිරීම හේතුවෙන් මෙම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඊ) මණ්ඩලයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීම පෞද්ගලික ගලි සේවාවක් මගින් සිදු කරන අතර 2024 වර්ෂයේදී මේ සඳහා රු.406,500 ක් ගෙවා තිබිණි. සීදූව කටුනායක නගර සභාව මගින් ගලියක් සඳහා රු.6,000 ක මිලක් යටතේ සේවාව සිදුකර ගත හැකිව වුවද රෝහල විසින් පෞද්ගලික සැපයුම්කරුවෙකු යොදාගෙන ගලියකට රු.8,500 ක් හා රු.10,000 ක් ලෙස ඉහළ රේටයක් යටතේ එම සේවාව සලසා ගැනීම හේතුවෙන් රු.136,500ක මුදලක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි. සේවාව සැපයූ ආයතනය විවිධ වර්ගවල බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර ආයතනය නමින් වූ ලියාපදිංචි අංක සහිත විධිමත් බිල්පත්/ඉන්වොයිසියක් ඉදිරිපත් කර නොතිබුණි. එම අවිධිමත් බිල් පත් සඳහා මණ්ඩලය විසින් ගෙවීම් සිදු කර තිබීමෙන් නිවැරදි බිල්පත් මත සිදු කළ ගෙවීම් ද යන්න විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව මණ්ඩලයේ ඉකුත් වර්ෂයේ අලාභය රු.11,587,172 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අලාභය රු.46,955,294 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අලාභයේ වැඩිවීම සියයට 405.23ක් වී තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

6